**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය - 2015**

---

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 76(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය පිහිටුවීම

---

1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරිය පනත මඟින් ස්ථාපනය කර තිබුණු පරමාණුක ශක්ති අධිකාරිය 2014 දෙසැම්බර් 31 දින සිට අහෝසි කර, 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත මඟින් 2015 ජනවාරි 01 දින සිට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සහ ශ්‍රී

ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව ස්ථාපනය කර තිබුණි. ජාතික සංවර්ධන අවශ්‍යතා උදෙසා න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය උපයෝගී කරගැනීම ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය මගින් සිදුකරනු ලබයි. මණ්ඩලය ස්ථාපනය කිරීමේදී පරමාණුක ශක්ති අධිකාරිය සතුව පැවති රු.864,205,322 ක ශුද්ධ වත්කම් මණ්ඩලයට පවරා තිබුණි.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-------------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**-------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ අයිතම ධාරණ අගයත් එහි සාධාරණ අගයත් සැළකියයුතු තරම් වෙනස්කම් වලින් යුක්ත වන්නේ නම් ප්‍රත්‍යාගණනය අවශ්‍ය වුවද, දීර්ඝ කාලයක සිට පිරිවැයට අගය කර තිබූ වත්කම් මණ්ඩලයට පැවරීමේදී ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**------------------------**

දේපළ, පිරියත හා උපකරණ යටතේ දැක්වෙන කෝබෝල්ට් 60 ප්‍රභවය ක්ෂය කිරීමේ පදනම ගිණුම්කරණ ප්‍රතිපත්ති තුළ හෙළිදරව් කර නොතිබුණු අතර 2014 වර්ෂයේදී පරමාණුක ශක්ති අධිකාරිය යටතේ පැවති ගැමා මධ්‍යස්ථානයේ වාණිජ කටයුතු ආරම්භ කිරීමට පෙර 2013 වර්ෂයට අදාලව හඳුනා ගන්නා ලද රු.10,044,000 ක් වූ කෝබෝල්ට් 60 ප්‍රභවයේ ක්ෂය ප්‍රමාණය විලම්භිත වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එම වටිනාකම අනාගත ඉපයුම්වලට එරෙහිව කපාදමන බවට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් යටතේ දක්වා තිබුණ ද 2014 හා 2015 වර්ෂවල ඉපයීම්වලට එරෙහිව එම වියදම හෝ ඉන් කොටසක් හෝ කපාහැර නොතිබුණු අතර කපාහැරීම සම්බන්ධ නිශ්චිත ප්‍රතිපත්තියක් හඳුනාගැනීමකින් තොරව 2015 දෙසැම්බර් 31 දිනටද විලම්භිත වියදමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත හා උපකරණවල වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ වටිනාකම සමඟ සැසඳීමේදී රු.280,406 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම අදාල උපලේඛන සමඟ සැසඳීමේදී රු.817,434 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

2015 ජනවාරි 01 දින පරමාණුක ශක්ති අධිකාරියේ පොත් අගය රු.190,768,275 ක්වූ ස්ථාවර වත්කම් අයිතම 07 ක් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට පැවරීමේදී භෞතික සමීක්ෂණයකින් තොරව පවරා තිබීම නිසා එම වත්කම්වල පැවැත්ම පිළිබඳ තහවුරුවක් විගණනයේදී ලබාගත නොහැකි විය.

**2.3 ගෙවිය යුතු ගිණුම්**

සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු රු.16,601,305 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| | **නීති රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 371(2) | අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවත් නියැදි විගණන පරීක්ෂණයට අනුව සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු මාසය දක්වා අවස්ථා 19 කදී ලබාදී තිබුණු අත්තිකාරම් දින 47 සිට දින 320 දක්වා ප්‍රමාදවී පියවා තිබුණි. |
| (ආ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | විධිමත් දිරි දීමනා ක්‍රමයක් පිළියෙල කිරීමෙන් තොරව හා මහා භාණ්ඩාගාරයෙන් ඊට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් තොරව මණ්ඩලය විසින් 2015 වර්ෂය සඳහා එහි සේවකයන්ට රු.1,950,000 ක මුදලක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.20,985,772 ක ඌනතාවයක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත අනුව, න්‍යෂ්ටික තාක්ෂණයේ සාමකාමී යොදාගැනීම් ප්‍රවර්ධනය කිරීම සහ දිරි ගැන්වීම සහ ඒ තාක්ෂණය උපයෝගී කරගෙන සේවා සැපයීම, ඒ සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, නව ක්‍රමෝපක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ ඒවාට ආධාර කිරීම,

විකිරණ ආරක්ෂාව සඳහා වන සේවා සැපයීම, වාණිජ හෝ වෙනත් කාර්ය සඳහා අයනීකාර විකිරණ සහ අනුපූරක තාක්ෂණ සම්බන්ධිත ක්‍රියාකාරකම්වල නිරතවීම මණ්ඩලයේ අරමුණු වේ.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් වර්ෂ 30 ක කාලයක් සඳහා බදු පදනම මත ලබාගත් ඉඩමෙහි රු. මිලියන 746.6 ක් වැයකර ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස බහුකාර්ය ගැමා විකිරණ පහසුකම් (Multipurpose Gamma Irradiator Facility) මධ්‍යස්ථානය ඉදිකර තිබුණි. එම මධ්‍යස්ථානය 2015 වර්ෂයේදී මණ්ඩලය වෙත පවරන ලද අතර ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) 2015 වර්ෂයේ දී මධ්‍යස්ථානයේ සේවා අලෙවියෙන් සියයට 97 ක් ලබාගත් ප්‍රධාන ගනුදෙනුකරු 2016 වර්ෂයේදී අහිමි වීම නිසා මධ්‍යස්ථානයේ යන්ත්‍රාගාරයේ මෙහෙයුම් කටයුතු ද 2016 ජනවාරි 28 දින සිට නැවතී තිබූ අතර 2015 මුල් මාස තුනට සාපේක්ෂව 2016 මුල් මාස තුනෙහි ආදායම සියයට 72 කින් පහළ ගොස් තිබුණි. ඒ අනුව ගැමා මධ්‍යස්ථානය එකම ආයතනයක් මත සේවා අලෙවිය රැඳී පැවතීම නිසා ඉදිරි කටයුතු පවත්වාගෙන යාම පිළිබඳ අවදානමකට ලක්වී තිබූ අතර, ඇතිවන අනාගත අවධානම හඳුනාගෙන විකල්ප සේවා ලාභීන් හඳුනා ගැනීමට හා දිරි ගැන්වීමට ප්‍රමාණවත් වැඩපිළිවෙලක් යොදා නොතිබුණි.

(ii) ඉහත (i) පරිදි මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු නවතා දමා තිබුණද, මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක වූ කාලපරිච්ඡේදයට සාපේක්ෂව එහි පුනරාවර්තන වියදම්වල පැහැදිලි අඩුවීමක් නොතිබුණු අතර මෙහෙයුම් කටයුතු වෙනුවෙන් සේවකයන් සඳහා ගෙවන විශේෂ අතිකාල හා නිවාඩුදින වැටුප් වැනි දීමනා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තව දුරටත් ගෙවා තිබුණි.

(iii) ශ්‍රී ලංකා රජය සතු ප්‍රවිකිරණ පහසුකම (Irradiation Facility) සහිත එකම ආයතනය වන ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ සම්පත් උපයෝගී කර ගනිමින් රාජ්‍ය ආයතනවල ඇණවුම් හෝ ප්‍රවිකිරණ පහසුකම් සඳහා ගැමා මධ්‍යස්ථානය වෙත යොමු කර විදේශ විනිමය ඉතිරි කරගැනීමේ හැකියාව පිළිබඳ රජයේ අවධානය යොමුවී නොතිබුණි.

(ආ) මණ්ඩලයේ ගොඩනැගිලි සංකීර්ණය මාලඹේ තොරතුරු තාක්ෂණ උද්‍යානය තුළ ප්‍රතිස්ථාපනය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2015 අගෝස්තු මාසයේ සිට ප්‍රතිස්ථාපන කටයුතු සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත්කර තිබුණද, 2015 දෙසැම්බර් 31 දින දක්වාම ඔහුගේ කාර්යභාරය හා සේවා කොන්දේසි පිළිබඳ විස්තර ඇතුළත් ගිවිසුමකට එළඹීමකින් තොරව වැටුප් හා අනෙකුත් දීමනා ලෙස රු.516,946 ක් ගෙවා තිබුණි.

(ii) මණ්ඩලයේ කටයුතු වලින් පරිසරයට හා මහජනතාවට හානිදායක සෞඛ්‍ය ගැටළු ඇතිවිය හැකි බව පවසමින් ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවයක් හේතුවෙන් මෙම ප්‍රතිස්ථාපනය සඳහා වූ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු 2015 ජූනි මාසයේ සිට සම්පූර්ණයෙන් නවතා දමා තිබුණි. විගණිත දිනය වන විට මාස 10 ක පමණ කාලයක් ඉදිකිරීම් කටයුතු නැවතී තිබුණු අතර මණ්ඩලයේ ප්‍රතිස්ථාපන කටයුතුද ඒ හේතුවෙන් ප්‍රමාදවන බැවින් පහත අවාසිදායක තත්ත්වයන් ඇතිවිය හැකි බැව් නිරීක්ෂණය විය.

* මණ්ඩලය ඔරුගොඩවත්තේ සිට මාලඹේට ගෙනයාම ප්‍රමාදවීම හේතුවෙන් යෝජිත නව කැළණි පාලම ව්‍යාපෘතියද ප්‍රමාද වීම නිසා එමගින් එම

ව්‍යාපෘතියට යන පිරිවැය ඉහළ යාම හා ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීම තුළින් මහජනතාවට අත්වන ප්‍රතිලාභ ප්‍රමාද වීම.

* මණ්ඩලයේ කටයුතු වඩාත් පුළුල් කරගැනීමට සිදුවන ප්‍රමාදය හේතුවෙන් න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය උපයෝගී කරගනිමින් රටට අත්කරගත හැකි ප්‍රතිලාභ ලැබීම ප්‍රමාද වීම.

(ඇ) මණ්ඩලය සඳහා හඳුන්වා දී තිබූ නව ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය සඳහා 2015 දෙසැම්බර් 31 දින වනවිට රු.820,000 ක් ගෙවා තිබුණි. මෙය නිවැරදිව ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳව 2016 මැයි 24 දින දක්වාම උපදේශකවරයෙකු ලවා පරීක්ෂා කරවා ගෙන නොතිබුණි. සේවකයන් විසින් මෘදුකාංග පද්ධතිය මගින් කටයුතු කරගෙන යාමට අනුගතවන තෙක් මෘදුකාංග පද්ධතියට සමගාමීව ආයතනයේ පොත්පත් අතින් ලියා (Manually) පවත්වාගෙන යා යුතු වුවත් (Parallel Run) 2015 වර්ෂයේ පොත්පත් ඒ අනුව පවත්වා නොතිබුණු බැවින් ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියේ දෝෂ පිළිබඳ තක්සේරුවක් ලබාගත නොහැකි වී තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා කෝබෝල්ට් 60 ප්‍රභවය 250 KCi ක් සපයා ප්‍රවාහනය කර ස්ථාපනය කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර සැපයුම්කරුවෙකු තෝරාගෙන තිබූ අතර 2015 දෙසැම්බර් 28 දින ඒ සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් රු.125,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. නමුත් අපේක්ෂිත පරිදි ඇණවුම් වර්ධනය වීම වෙනුවට ගැමා මධ්‍යස්ථානයේ ප්‍රධානතම ගනුදෙනුකරුගේ ඇණවුම අහිමි වීම මත කෝබෝල්ට් 60 ප්‍රභවය ඇණවුම් කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවීම නිසා විගණිත දිනය වූ 2016 අප්‍රේල් 27 දින වන විටත් එම ඇණවුම් කිරීම නවතා දමා තිබුණි. භාණ්ඩාගාරයෙන් ලබාදී තිබූ රු.125,000,000 ක ප්‍රතිපාදිත මුදල අදාල කාර්යය සඳහා පමණක් යොදාගත යුතු බවට අවධාරණය කර තිබියදීත් මණ්ඩලය විසින් 2016 ජනවාරි 08 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2016 ජනවාරි 18 දින එම මුදල ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ගබඩා ස්වයංක්‍රියකරණය කිරීමේ අරමුණ සඳහා පරමාණුක ශක්ති අධිකාරිය විසින් 2011 වර්ෂය තුළදී රු.389,375 කට මිලදී ගෙන තිබුණු පරිගණක මෘදුකාංග පැකේජය 2014 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණ අතර කිසිදු ප්‍රයෝජනයකින් තොරව එය භාවිතයෙන් ඉවත්කර තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ මූල්‍ය හා පරිපාලන අංශයන් ස්වාධීන කිරීම සඳහා අධ්‍යක්ෂ මූල්‍ය හා අධ්‍යක්ෂ පරිපාලන වශයෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක් 2015 දෙසැම්බර් 04 දින අනුමත කරගෙන තිබුණද, එම තනතුරු දෙක 2016 ඔක්තෝබර් 15 දින දක්වාම පුරප්පාඩුව පැවතුණි. එම තනතුරු දෙකෙහිම කාර්යයන් අනුමත නොවූ තනතුරක සිටින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය හා පරිපාලන) විසින් ආවරණය කර තිබුණු අතර අදාල අංශවල ස්වාධීනත්වය තහවුරු වී නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය සඳහා යන්ත්‍රාගාර මෙහෙයුම් කළමනාකරු තනතුරක් අනුමත කරගෙන තිබුණද, එම තනතුර පුරප්පාඩුව පැවතීම නිසා යන්ත්‍රාගාරයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු වෘත්තීය සුදුසුකම් ලත් නිලධාරියකුගේ අධීක්ෂණයට ලක් වී නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන අංශය සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොවීම නිසා අභ්‍යන්තර විගණන සැලැස්මෙන් ප්‍රමාණවත් කොටසක් ආවරණය කිරීමට නොහැකි වී තිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

මණ්ඩලය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද, එය සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට හා අයවැය ලේඛනයට අනුකූලව නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

අයවැය ලේඛනය සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 05 කදී සංශෝධනය කර තිබුණු අතර වැය විෂයයන් 14 ක අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 32 සිට සියයට 294 දක්වා විචලතාවයන් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | දේපල, පිරියත හා උපකරණ අගය කිරීම, ලේඛනගත කිරීම, ආරක්ෂා කිරීම හා මණ්ඩලයේ සම්පත් කාර්යක්ෂමව උපයෝජනය කිරීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොතිබීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | විධිමත් පරිදි සේවකයින් වෙත රාජකාරී පවරා දී නොතිබුණ අතර පවතින වැටුප් විෂමතා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම. |